# 8. මආහිමුල් ඉස්ලාමියා

## 8:1 සමාජ සේවය ඉටු කරමු

* අනුන්ගේ යහපත සලකා ඉටු කරන ක්‍රියා සමාජ සේවය වේ.
* සමාජ සේවය මිනිසුන් අතර ඇති සම්බන්ධතාවය ශක්තිමත් කරන්නා වූ, එක් උසස් මාර්ගයක් වේ.
* මිනිසා සිය ජීවිතයේ ආත්මාර්ථකාමියෙක් ලෙස නොව පරාර්ථ කාමියෙක් ලෙස සිටීමට උත්සාහ කළ යුතු ය.
* සමාජ සේවයේ යෙදෙන තැනැත්තා සිය මරණයෙන් පසුව ද ඒ සඳහා වූ ඵල ලබා ගනී.
* ජමාඅත් වශයෙන් සලාතය ඉටු කිරීම අධික ආනිසංස ලබා දෙයි.

මිනිසා විවිධ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට විවිධ උත්සහයන් දරයි. සිය අවශ්‍යතාවයන් තමාගේ ම උත්සාහයන් මගින් ද, පොදු අවශ්‍යතාවයන් සාමූහික උත්සාහය මගින් ද ඉටු කර ගත හැකි ය. මෙලෙස සාමූහික උත්සාහවල යෙදීමට අවකාශය ලැබෙන්නේ ද ස්වල්ප පිරිසකටයි. මෙවැනි අවස්ථාවන් ලැබෙන්නේ ද අනුන්ගේ යහපත උදෙසා සැලකිලිමත්වන පුද්ගලයින්ට පමණි.

මුස්ලිම්වරයකු වශයෙන් ඔහු ඉටුකරන මෙම කර්තව්‍ය එක් දනයක් ලෙස සැලකිය හැක. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා මේ පිළිබඳ ව මෙසේ ප්‍රකාශ කළහ.

كُلُّ مَعْرُوْفٍ صَدَقَةٌ

"සෑම යහපත් කාර්යක් ම දනයක් වේ" අන් අයගේ යහපත උදෙසා යම් කාර්යක් කරන විට අනුන්ගේ ආදරය දිනා ගැනීමට හැකි වේ. යහපත් වූ සමාජ සේවයේ නියලෙන ලෙස නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා අපව දිරිමත් කර ඇත. විවිධ දනයන් පිළිබඳව ප්‍රකාශ කර ඇති එතුමා, මිනිසාගේ මරණයෙන් පසුව ද යහ ඵල ලබා ගන්නා මාර්ගයන් පිළිබඳ ව ප්‍රකාශ කර ඇත.

යම් කෙනෙකු මිය යන විට ඔහුගේ මරණයෙන් පසු ව පහත සඳහන් දෑ අතහැර යයි.

1. අන් අයට උගන්වන ලද අධ්‍යාපනය
2. යහ ගුණාංගයෙන් යුත් දරුවන්
3. ඔහු ජීවතුන් අතර සිටින කාලයේ දී ඉටු කරන ලද ස්ථාවර දනයන්

ඉහත සඳහන් ක්‍රියාවන් කෙනෙකුගේ මරණයෙන් පසුව ද ඔහුට යහ ඵල ගෙනදේ. (ඉබ්නු මාජා) යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා පවසා ඇත.

ඉහත සඳහන් කළ සියලුම කාර්යයන් පොදු සේවයට ඇතුළත් වේ. මේවායෙන් කුමන හෝ ආකාරයෙන් තමාගේ සහයෝගය ද ලබා දෙමින් සමාජ සේවයේ නිරත වීමට ශිෂ්‍යයන් වන අප පුරුදු විය යුතු ය. අන් අයට ප්‍රයෝජනවත් අන්දමින් ජීවත්වීම ඉස්ලාම් අගය කරයි.

" خَيْرُ النَّاسِ أَنْفَعُهُمْ لِلنَّاسِ "

" මිනිසුන් අතර ශ්‍රේෂ්ඨවන්තයා මිනිසාට ප්‍රයෝජනවත් තැනැත්තා ය" යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ප්‍රකාශ කර ඇත.

බහු ආගමික ජාතීන් ජීවත්වන රටක අපි ජීවත් වෙමු. අන් අය සමග යහපත් ලෙස හැසිරෙමින් සමාජ සේවයේ යෙදීම තුළින් අප යහපත්, ශ්‍රේෂ්ඨ අය ලෙස සලකනු ලැබේ. අපගේ රටේ ඇතිවුණු විවිධ ස්වභාවික අනතුරුවලදී සෑම සමාජයකට ම අයත් වූ අය එකමුතුව ඉටුකළ සමාජ සේවාවන් බොහෝම ය. උපකාර කිරීම තුළින් කෙනෙකුගේ සිත දිනා ගත හැකි ය.

2004 වර්ෂයේ දකුණු ආසියාතික රටවල්වල ඇති වුනු "සුනාමි" ව්‍යසනය අදටත් සියලු දෙනාගේ ම සිත් තුළ රැඳී ඇත. ආහාර පාන ලබා දීමෙන් ද, ඇඳුම් පැළඳුම් ලබා දෙමින් ද, ඉඳුම් හිටුම් ලබා දීම තුළින් ද වෛද්‍ය ප්‍රතිකාර කරමින් ද විවිධ උදව් උපකාරවල යෙදුනහ. ආගම්, කුල, ජාති භේදයකින් තොරව උදව් උපකාර මේ රටට එකතු විය. මෙවැනි සමාජ සේවයන් හි නිරත වීමට අප පුරුදු විය යුතු ය.

මදීනා නගරයේ දක්නට තිබුණු "බිඃරු රූමා" නැමති ළිඳ "උස්මාන්" රළියල්ලාහු අන්හු තුමා විසින් මිළදී ගෙන පොදු ප්‍රයෝජන සඳහා දෙන ලදී. යන සිද්ධිය අපි ද දන සිටින්නෙමු. අපගේ දේශයේ ද පොදු ප්‍රයෝජන උදෙසා නිර්මාණය කරන ලද ළිං බොහෝමයක් ඇත. පොදු ප්‍රයෝජන උදෙසා පරිත්‍යාග කරන ලද පාසල් ඉඩම් ද ඇත.

කුඩා ගම්වල විවිධාකාර සමාජ සෙවයන් ඉටුකෙරේ. එම ග්‍රාමයේ ජීවත්වන මුස්ලිම්, ද්‍රවිඩ, බෞද්ධ, වෙනත් ආගමික ජනයා අසල්වැසියන් ලෙස ජීවත්විය හැකි ය. මෙම අවස්ථාවේ දී මුස්ලිම්වන අප ද අපගේ දයකත්වය ලබා දීම වැදගත් ය. මාර්ග නිර්මාණ කිරීම ද කානු පද්ධති පිරිසිදු කිරීම ද, පොදු ළිං පිරිසිදු කිරීම ද පාසල් භූමියේ ඇති කැලෑවන් කපා පිරිසිදු කිරීම ආදී විවිධ කාර්යවල නිරත වීම ශ්‍රමදනය යන නමින් සිදුකෙරේ. එවැනි පොදු කාර්යන්වල අප ද නිරත විය යුතු ය. පාසල් ජීවිතයේ දී අප තුළ ඇති මෙම යහ ගුණ අනාගතයේ දී ද මෙවැනි කාර්යන්වල නිරත වීමට දිරි ගන්වයි. මෙසේ ඉටු කිරීම තුළින් බහු ජාතික සමාජයේ අන්‍යෝන්‍ය අවබෝධයකින් යුතු ව ජීවත්විය හැකි ය.

## අභ්‍යාසය

1. ඉස්ලාමීය දෘෂ්ටී කෝණයෙන් පොදු සේවය යනු, පුළුල්වූ එකක් ද නැද්ද යන්නෙන් විමසන්න.
2. ඔබ සහභාගී වූ සමාජ සේවයක් සම්බන්ධ කොට පැවරුමක් ලියන්න.
3. ඉස්ලාම් පෙන්වා දී ඇති දාන මාර්ගයන් සඳහන් කරන්න.
4. "මිනිසා අතරින් ශ්‍රේෂ්ඨ වන්තයා මිනිසුන්ට ප්‍රයෝජනවත් තැනැත්තා ය" යන කියමන මුල් කරගෙන කතාවක් ලියන්න.

## 8.2 සන්නිවේදනය සහ ඉස්ලාමය

- සන්නිවේදනය ඉස්ලාමයේ කොතරම් දුරට වැදගත් ද යන්න දැනගැනීම.
- සන්නිවේදනය සහ ඉස්ලාමය අතර ඇති සම්බන්ධතාවය දැනගැනීම.
- නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ කාලයේ තිබූ සන්නිවේදනය දැනගෙන ලේඛන ගත කිරීම.
- සන්නිවේදනය තුළින් ඉස්ලාමය පිරිපුන් බවට පත් කිරීම.
- වර්තමාන සන්නිවේදනය සහ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ කාලයේ සන්නිවේදනයන් අතර වූ වෙනස්කම.

පුරාණ කාලයේ සිට නවීන යුගය දක්වා සියලු ම සමාජයන් යම් අයුරකින් සන්නිවේදන ක්‍රමයේ අදහස් පළ කර ඇත. මෙම සන්නිවේදන ක්‍රමයේ සමාජ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යෑමටත් සමාජ උරුමයන් එක් පරම්පරාවක සිට තවත් පරම්පරාවකට ගෙන යෑමට ද ඉවහල් වේ. මෙම සම්බන්ධතාවය විවිධ මාර්ගයන් ඔස්සේ ඇතිවේ. එනම් ආරම්භක කාලයේ සලකුණු, සංඥා, මුහුණත්, ඉරියව්, ශබ්ද, කථාව සහ අකුරු යනාදී විවිධ ස්වරූපයන් වලින් දැකිය හැක.

නමුත් ඉස්ලාමීය පාලන සමයේ ඉස්ලාමයේ පදනම් මූලාශ්‍රයන් වන"අල්කුර්ආනය" සහ "අස්සුන්නාහ්" (අල්හදීස්) යන ඉතා වැදගත් සහ පැරණි මාධ්‍යයන් දෙක වේ. අල්කුර්ආනය සහ අල්හදීස් මත ඉස්ලාමය රඳා පවතින්නේ ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මේවා ලිවීමටත්, කටපාඩම් කිරීමටත්, අනුන්ට මේවා දැනුවත් කිරීමටත්, සහාභාවරුන් දිරි ගැන්වූහ. මොවුහු මේවා පදනම් කරගෙන නව චින්තන හා අදහස් බිහි කළ අතර එකී අදහස් ලිඛිතවද සංරක්ෂණය කරවූහ. එබැවින් මේවා ප්‍රයෝජනවත් වෙමින් පවතින අතර ආරක්ෂා වෙමින් ද පවතී.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් තනි පුද්ගලයින් මඟින් ද ගෝත්‍ර මඟින්ද වැදගත් ස්ථාන සහ දිනයන් ද භාවිත කර ඍජුව සහ වක්‍රව සන්නිවේදනය උපයෝගී කළහ.

හිජ්රතයට පෙර මදිනාවේ වැසියන්ට අල්කුර්ආනය ඉගැන්වීම සඳහා මුස්අබ් ඉබ්නු උමෛර් රලියල්ලාහු අන්හු උම්මි මක්දූම් රලියල්ලාහු අන්හු තුමන්ව මදීනාවට යැවූහ. පසුව මදීනාවේ සිට මක්කාවට මුආද් ඉබ්නු ජබල් රලියල්ලාහු අන්හු තුමාණෝ තම නියෝජිතයෙක් ලෙස යැවූහ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ඍජු සන්නිවේදනය (කථාව, සාකච්ඡා) මගින්, වක්‍ර සන්නිවේදනය (අකුරු, ලිපි) මගින් ද, දූතයන් මගින් ද කර තිබේ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන්ට ලැබුණු සන්නිවේදනය භාවිත කර, ඒවායින් සන්නිවේදනය ඉටුකර ගත්තේ ය. එනම් අකබා කන්ද සහ සෆා කන්ද

ඔටුවාගේ පිට, දාරුල් අර්කම්, උක්කාල්, මිජන්නා, තුල් මජාස් යනාදී වෙළෙඳ පොළවල් මස්ජිදය, එහි මිම්බරය, ශාලාව, මිජන්නා, මැදනා මෙහිලා සැලකිල්ලට ගත හැකි ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ ජීවිතයේ "මස්ජිදය", වැදගත් තැනක් ලෙස සැලකෙයි. (කේන්ද්‍රස්ථානය), ආගමික, සංස්කෘතික පීඨයක් ලෙස ද, සමාජ උත්සව වල මධ්‍යස්ථානයක් ලෙස ද, හමුදා කටයුතු පිළිබඳ පදනමක් ලෙස ද, ආර්ථික කඳවුරක් ලෙස ද, සහ අධ්‍යාපන ආයතනයක් වශයෙන් ද භාවිතා කළහ. මස්ජිදුන් නබවියේ එක් පැත්තක පිහිටා තිබුනු පිල (අස්හාබුස්සුෆ්ෆා වරුන්ගේ) සන්නිවේදන මධ්‍යස්ථානය මෙන් ම හල්කාවරුන්ගේ අධ්‍යාපන වට පවත්වන ලද ස්ථානය වශයෙන්ද ප්‍රයෝජනයට ගන්නා ලදී. ඒ සමඟම ආගමික, සමාජීය හා දේශපාලන ස්ථානයක් ලෙස ද තිබූ අතර නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ උපදේශන රැස්වීම් හා අමුත්තන් සමඟ සාකච්ඡා ද මෙහි දී පවත්වන ලදී.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් විසින් පුරුෂයන් සහ ස්ත්‍රීන් හමුවී සාකච්ඡා කිරීම සඳහා කාලවේලා වෙන වෙනම වෙන්කර තිබුණි. එතුමා විසින් භාවිත කරන ලද සන්නිවේදන උපාය විධි වලට සලාතය සඳහා වූ අදාන් කීම සහ ජමාඅත් සලාතය සඳහා විශාල පිරිසක් රැඳී සිටින අවස්ථාවල සිදු කෙරෙන පිළියැවුම් ක්‍රමයේ තක්බීර් හඬ ක්‍රියාත්මක කරන ලදී.

ඉස්ලාමයේ පළමු කුත්බා දේශනය කුබා දේශයට අයත් "වාදිසාලිම්" යන ස්ථානයේ සිට පැවැත් වීය.

සන්නිවේදන අවස්ථාවල සහ සහාභාවරුන් මෙය පැහැදිලිව තේරුම් ගැනීම සඳහා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් වචනයෙන් වචනය නතර කරමින් කථා කිරීම, වැදගත් කරුණු තුන්වරක් කීම, සවන් දීමේ උනන්දුව ඇති කර විස්තර කිරීම, සහ හැකි සෑම උපාය මාර්ගයක්ම භාවිත කිරීම වැනි උපාය විධි සැලකුව මනාය.

වක්‍ර සන්නිවේදන අවස්ථාවක දී තමා සමඟ සම්බන්දතාවයේ යෙදී සිටි කණ්ඩායමට පුහුණුව ලබාදීම සඳහා "දාරුල් අර්කම්" යන ස්ථානය තෝරා ගන්නා ලදී. එම අවස්ථාවේ ම, "දාරුල් ඉන්ෂා" නැමැති ලේඛනාගාරය ද පිහිටුවා ගන්නා ලදී. තම පණිවිඩය ගෙන යාමට විශේෂ දූතයන් සහ ලේඛකයන් ද පත්කර ගත්හ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ කුළුඳුල් දේශනය ඉතා රහසිගතව සිදු කළහ. පළමුවෙන් ම කදීජා රලියල්ලාහු අන්හා තුමිය ඉස්ලාමය වැළඳගත්හ. පසුව අලි රලියල්ලාහු අන්හු තුමාණෝ ද, අබූබක්කර් රලියල්ලාහු අන්හු තුමාණෝ ද ඉස්ලාමය වැළඳ ගත්හ. මෙලෙස මෙම අවස්ථාවේ 40 දෙනෙක් ඉස්ලාමය වැළඳ ගත්හ. මෙලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා යොදගත් සන්නිවේදන ක්‍රමයන් ඉස්ලාමයේ දියුණුවේ උච්චතම ස්ථානයට ලඟා වීමට හේතු විය.

පළමුවෙනි නබිත්වයේ (නුබුව්වත්5) ඇබිසීනියාවට (නවීන ඉතියෝපියා) ජදපර්

ඉබ්නු අබූතාලිබ් රලියල්ලාහු අන්හු තුමාගේ නායකත්වයෙන් එක් දූත කණ්ඩායමක් යැවූහ. මදීනාවට (නුබුව්වත් 11) මුස්අබ් ඉබ්නු උමෛර් රලියල්ලාහු අන්හු තුමාණෝ තම නියෝජිතයා වශයෙන් යැවූහ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අකබා කන්ද අසල කස්රජ් ජාතීන් හය දෙනෙක් මුණ ගැසුණේ ය. (1 වන අකබා ගිවිසුම) මදීනා අවධියේ යෙමන් රටට මුආද් ඉබ්නු ජබල් රලියල්ලාහු අන්හු තුමන් නියෝජිතයා වශයෙන් යැවීය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ බුරාක් නම් වාහනයේ ආකාශ ගමන ඉටු කළහ. එහි ආදම් අලෛහිස්සලාම් තුමා ඉබ්රාහිම් අලෛහිස්සලාම් තුමා මූසා (අලෛහිස්සලාම්) තුමා යන දූතයින් හමුවූ අතර, සර්ව බලධාරී අල්ලාහ්ව හමුවී සාකච්ඡා කර, පංචකාල සලාතය මුස්ලිම්වරුන්ට තෑගි වශයෙන් ගෙන ආහ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්, විසින් අබුබක්කර් රලියල්ලාහු අන්හු, උස්මාන් රලියල්ලාහු අන්හු අබ්දුර් රහ්මාන් ඉබ්නු අව්ෆ් රලියල්ලාහු අන්හු, අලි රලියල්ලාහු අන්හු තුමාණන් ආදී අය සමග ඒක පුද්ගල සම්බන්ධතාවයක් පවත්වන ලදී. විවෘතව දේශනාවට සුපුරුදු පරිදි උසස් ම කන්දවන "සෆා කන්ද" තෝරා ගන්නා ලදී. නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "සෆා කන්ද" උඩට නැග එක් එක් ගෝත්‍රිකයන්ව කැඳවූහ. එසේ රැස්වූ පිරිස බලා, "අල්ලාහ් හැර අන් වස්තූන් නොවඳින්න" යනුවෙන් පැවසූහ. එවිට කුරෛෂිවරු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට දොස් නගන්නට පටන් ගත්හ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන්ගේ දූත පිරිස මගින් පලාත් සභාපති වරුන් වෙත, ගෝත්‍රයන් නායකයින් වෙතට ලිපි සහ චක්‍ර ලේඛ යවන ලදී. මුද්දර සහිත හසුන් අවට ප්‍රදේශ වල පාලකයන් වෙත යවන ලදී. ඇබිසීනියා රජතුමා වෙත අම්ර් ඉබ්නු උමෛයා රලියල්ලාහු අන්හු තුමා, රෝම අධිරාජ්‍යයා වෙත තහියතුල් කල්බි රලියල්ලාහු අන්හු තුමා, පර්සියානු අධිරාජ්‍යයා වෙත අබ්දුල්ලාහ් ඉබ්නු හුසෙයිමා රලියල්ලාහු අන්හු තුමා ඊජිප්තු රජ වෙතට හාතිබ් ඉබ්නු අබී බල්තආ රලියල්ලාහු අන්හු හසුන් ගෙන යන ලදී.

## යවන ලද හසුන්

මෙලෙස යවන ලද හසුන් අනුකරණය කරමින් උමර් රලියල්ලාහු අන්හු තුමා විසින් දිවානුල් බරීද් නැමැති තැපැල් දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කරන ලදී. මෙය උමෛයා වරුන්ගේ පාලන සමයේ දිවානුල් බරීද් වල්අක්බාර් යන නමින් තැපැල් හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවක් ලෙස වර්ධනය විය. මේ හැර මේ සන්නිවේදන මෙහෙවර දිවානුල් කාත් තම් (මුද්දර දෙපාර්තමේන්තුව) දිවානුල් කාදීර් (සන්නිවේදන දෙපාර්තමේන්තුව) යනාදී අංශ විසින් සිදුකර තිබේ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා තම ලිපි සහ චක්‍ර ලේඛ යනාදිය ලිවීම සඳහා ලේඛකයින් පත් කර තිබිණි. ඉන් සමහරු අල්කුර්ආනය පිටපත් කළහ.

තවත් සමහරු රටේ විවිධ සිද්ධීන් වාර්තා කළහ. සෛද් ඉබ්නු සාබිත් රලියල්ලාහු අන්හු තුමා රජවරුන්ට ලිපි ලිවීම සඳහා ද අබ්දුල්ලාහ් ඉබ්නු අර්කම් රලියල්ලාහු අන්හු තුමා ණය ගනුදෙනු ලිවීම සඳහා ද පත් කළේ ය. තව ද භාෂා පරිවර්තකයින් ද පත් කරන ලදහ.

සන්නිවේදනයේ උදක් ම අදහස් පමණක් ඉදිරිපත් නොකර ප්‍රදර්ශන පරිහරණය ද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ සිරිතක් විය. නිදසුනක් වශයෙන් ඍජු මාර්ගය ඉස්ලාමය පමණක් ගෙන හැර දක්වනු පිණිස විවිධ රේඛාවන් ඇද ඍජු රේඛාව පෙන්වා දී ඇත. "මෙය මාගේ ඍජු මාර්ගය වේ. එය අනුගමනය කරන්න. වෙනත් මාර්ග නොපිළිපදින්න. ඒවා ඔබ (ව) අල්ලාහ්ගේ මාර්ගයෙන් බැහැර කරන්නේ ය." (6:153) තවද මුස්ලිම් සහෝදරවරුන්ගේ එකමුතුකම යැයි ඇඟිලි දෙක එක්කර පෙන්වා දී ඇත. මෙහි රේඛාව අඳින ලද ස්ථානයද හා ඇඟිලි දෙක ද තොරතුරු සන්නිවේදනය වශයෙන් භාවිතා කර ඇත.

මෙලෙස විවිධ උපා විධි, වෙලාවේ සහ අවශ්‍යතාවයන්ට අනුව, පසු කලෙක සංවිධාන කටයුතුවල දී අනුගමනය කරන ලදී. අනුමැතිය යනු ඉස්ලාමීය නෛතික වගන්තිවලට අනුව හොඳ අදහස් ප්‍රචාරය කිරීමට සමාජ සාරධර්ම ප්‍රවර්ධනයට, අධ්‍යාත්මික ස්ථිරත්වය තහවුරු කිරීමට ඉවහල් වන සන්නිවේදන මාධ්‍ය පරිහරණය කිරීමට ඉස්ලාමය අනුමැතිය දෙයි.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා, ජනතාව සමඟ ඇතිකර ගත් සම්බන්ධතා සමස්ත ලෝකවාසීන්ට ම පොදු වේ. සෑම සන්නිවේදන ක්‍රමයක් ම ජනතාවට බලවත් හැඟීමක් ද ඉස්ලාමයේ දියුණුව ද ඇති කළේ ය.

නමුත් වර්තමානයේ ඇති සන්නිවේදන පිළිබඳ බලන කල සෑම කෙනෙකුගේ ම ජීවිතයේ ඉතා සමීප සම්බන්ධතාවක් දැකිය හැක. එය සමාජයට විවිධ සේවාවන් ඉටු කරමින් තිබේ. තොරතුරු ලබා දීම, අධ්‍යාපනය සහ විනෝදාංශ යන ආදිය සුපුරුදු සේවාවන්ව පැහැර හැර ඒවා පොදු අදහස ඇති කිරීමෙහි වැදගත් සේවාවන් ඉටු කරයි. අද සන්නිවේදනයේ ලිපි, විදුලි පණිවිඩ, පුවත්පත්, දුරකථන, ෆැක්ස්, පරිගණක හා ඊමේල් අන්තර්ජාල යනාදිය දයකත්වය ඉතා වැදගත් තැනක් ගනී. මෙම සන්නිවේදන මාධ්‍යයන් පොදු ජනයා සමඟ සම්බන්ධ වීමට උපයෝගි වන මාධ්‍යයන් වන නිසා මෙම මාධ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය ජනතාවට ප්‍රයෝජනවත් ලෙස තිබිය යුතු ය.

සෑම මිනිසෙක් ම දිනකට පැය කිහිපයක් තොරතුරු පරිහරණය සඳහා වැය කරයි. මිනිස්සු සියල්ලෝ ම සම අදහස් සහ සම ප්‍රමාණයේ තොරතුරු පරිහරණය නොකරති. එක් කණ්ඩායමට අයත් පිරිසක් තමන් අතර පමණක් තොරතුරු පරිහරණය භාවිතා කර ගනිති.

වර්තමාන ලෝකයේ සන්නිවේදන මාධ්‍යයන්ගෙන් වැඩි වශයෙන් ප්‍රයෝජනය තිබුනත්, සමාජ විරෝධී ඒවා ද දැකිය හැකිය. එම නිසා සන්නිවේදන මාධ්‍යයන් කොතරම් සාරධර්ම ලබා තිබිය යුතු ද? යන්න ඉස්ලාම් ගෙන හැර දක්වා ඇත.

## 1. සාක්ෂි සහිත වීම

සන්නිවේදන මාධ්‍ය විසින් පළකරනු ලබන තොරතුරු සාක්ෂි පදනම් කරගත් ඒවා විය යුතුයි. සංඛ්‍යා ලේඛන, නිල දැන්වීම් සහ මූලික සාධක ආදියෙන් ලබා ගන්නා තොරතුරුවල දී පවා මේ ගැන සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ. "ඔබ ඇත්ත කථා කරන්නේ නම් ඔබේ සාක්ෂි ඉදිරිපත් කරන්න." (27:64) යනුවෙන් අල්කුර්ආනයේ සඳහන් වෙයි.

## 2. විශ්වාසනීය භාවය

මාධ්‍යවේදින් තුළ සත්‍යවා දී භාවය සහ අමානත් පිළිබඳ හැඟීම් ඉතා වැදගත් ගුණාංගයන් වන්නේ ය. අනුමානය, හැඟීම, මනඃකල්පනය, විකෘති කිරීම, සහ බොරු මිශ්‍ර කිරීම යනාදියෙන් වැළකී විශ්වාසවන්ත ප්‍රවෘත්ති පමණක් පළ කිරීම් කළ යුතුයි."ඔබ ඇත්ත කථා කරන්නේ නම් සාක්ෂි සහිතව ඔබ මට දන්වා සිටින්න." (6:143) යන අල්කුර්ආනයේ සඳහන් වෙයි.

## 3. මධ්‍යස්ථ භාවය

මාධ්‍ය ක්ෂේත්‍රය කිසිම අවස්ථාවක ධාර්මික වගකීමක් සහිතව හෝ ජනවාර්ගික අදහස්වලට හෝ පක්ෂපාතිත්වයට වහල් වීම නුසුදුසුයි. ප්‍රවෘත්ති තොරතුරු වෙනස් කර විකෘති කර අතිශයෝක්තියෙන් හා අවතක්සේරු කරමින් පළ කිරීම ධර්මවලට පටහැනි වේ.

"විශ්වාසවන්තයිනි! ඔබ සාධාරණත්වය මත ස්ථාවර වන්න" (4:135) යනුවෙන් අල්කුර්ආනයේ ගෙන හැර දැක්වේ.

## 4. පොදු යහපත රැකීම

ප්‍රජාතාන්ත්‍රික ක්‍රමය යටතේ සෑම මිනිසෙකුට ම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තිබේ. ඒ අනුව මාධ්‍යවේදී නිදහස ද අනුමත වන්නේ ය. නමුත් මෙම අයිතිවාසිකම් භාවිත කරන විට එය මහජනතාවගේ යහපතට පටහැනි නොවන පරිද්දෙන් සිදු විය යුතුයි. වැරදි මගකට යොමුකරවන දෙයක් විකාශනය කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ පළ කිරීම සීමාව ඉක්මවා යෑම මෙන් ම සමාජයට ද්‍රෝහි ක්‍රියාවක් වෙයි. ඉස්ලාමයේ "අල්ලාහ් අදහස ප්‍රකාශ කිරීමේ නිදහස ලබා දී ඇත. නමුත් ඉස්ලාමීය දේශනයට පටහැනිව එම අදහස් නොතිබිය යුතුයි" යනුවෙන් කොන්දේසියක් ද ඇත. අල්ලාහ්ගේ දේවල් වලට බය නොවී කවරෙකු ඉදිරියේ දී ද සත්‍ය යන වචනය පවසන ලෙස අල්ලාහ් මුස්ලිම්වරුන්ට අණ කර ඇත.

## 5. සාරධර්ම රැකීම

ඕනෑම ප්‍රවෘත්තියක් සදාචාරාත්මක ලෙස ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ. සත්‍ය වචන භාවිත කිරීම අනුගමනය කළ යුතුයි.

"අසභ්‍ය වචන පවසමින් කෑමොර ගැසීම්" අල්ලාහ් (කිසිසේත්) නොරුස්සයි. (4:148) යනුවෙන් "අල්කුර්ආනය" සඳහන් කරයි.

සමාජ ජීවිතයේ මහජනතාව සමග ගෞරවනීය ලෙස ලස්සන වචන වලින් සාකච්ඡා කළ යුතු බවත් ,

එම නිසා සන්නිවේදන ක්ෂේත්‍රය මුළු මහත් මානව සංහතියේ යහපත අරමුණු කරගෙන යුක්තිය, සාධාරණත්වය හා මිනිස් අයිතිවාසිකම් සහතික කිරීමට හා රැක ගැනීමට ඉවහල් වන අතර, සාරධර්ම රැකීමට ද එක්සත්කම රැකගැනීමට ද මග සැලසිය යුතුය යනු ඉස්ලාමයේ බලාපොරොත්තුව වේ.

**අභ්‍යාස**

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් සන්නිවේදනය කෙසේ හඳුන්වා දී දියුණු කළේ ද යන්න විස්තර කරන්න.
2. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට පසු සන්නිවේදන ක්ෂේත්‍රය ව්‍යාප්ත වූයේ කෙසේ ද? යන්න සාධක සමඟ විස්තර කරන්න.
3. ඉස්ලාමය ලබා දී ඇති සන්නිවේදන සාරධර්ම දැනගෙන නව සන්නිවේදන ක්‍රමයන් සමඟ සසඳා ලියන්න.

**නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ කාලයේ මස්ජිද්වලින් ලබා දුන් දයකත්වය**

* ආගමික හා සංස්කෘතික පීඨයක් ලෙස :
  සලාතය, ජුම්ආ දේශනය, ඇදහිලි,
* දේශපාලන කාර්යාලය වශයෙන් :
  පරිපාලන කේන්ද්‍ර මධ්‍යස්ථානයක් ලෙස අණ කිරීම.
* සමාජ කටයුතුවල කේන්ද්‍රස්ථානයක් ලෙස :
  විවාහය, සාකච්ඡා කිරීම, සංස්කෘතික වැඩසටහන්
* යුද්ධ හමුදා මධ්‍යස්ථානයක් වශයෙන් :
  යුධ පුහුණුව ලබා දීම සැලසුම් කිරිම තොරතුරු ලබා ගැනීම.
* ආර්ථික කඳවුරක් වශයෙන් :
  භාණ්ඩාගාරය බෛතුල් මාල්
* අධ්‍යාපන :
  අල්කුර්ආන් තෆ්සීර් (විචාරණය) අධ්‍යයනය, පොදු කලාව, පුස්තකාලය, පරිවර්තන අංශය, කථාකිරීමේ කලාව.
* අධිකරණ පරිපාලන :
  විමසීම් කිරිම, විසඳුම් ලබා දිම.
* පොදු ජනතාවගේ යෝජනා සභාවක් ලෙස
* ගැටළුවලට විසඳුම් සෙවීමේ සමිතියක් ලෙස

## නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ කාලය

මක්කා කාල වකවානුවේ ප්‍රචාරක ක්‍රමය

* තනි පුද්ගල සම්බන්ධතා
  අබ්දුර් රහ්මාන් ඉබ්නු අව්ෆ් රලියල්ලාහු අන්හු, අලි රලියල්ලාහු අන්හු තුමාණන් සමග වූ සම්බන්ධතාවය.
* රහසිගත ප්‍රචාරය
  තමා සමග එකතු වූ කණ්ඩායමට පුහුණු කිරීම සඳහා දරුල් අර්කම් යන ස්ථානය තෝරා ගැනීම.
* ප්‍රසිද්ධ වූ ප්‍රචාරය
  සෆා කන්දට නැග පැවැත්වූ ප්‍රචාරය ( සුරා ලහබ් පහළ වීම)

  ගෝත්‍රයන් සමග සම්බන්ධතාවය
  සමහර අවස්ථාවල ගිවිසුම් ද අරගන්නා ලදී.

උදාහරණ අකබා ගිවිසුම, අව්ස් කස්රජ් ගෝත්‍රයට අයත් නියෝජිතයින් (මදීනා වැසියන් )

* වැදගත් දිනයන් සහ ස්ථානයන් භාවිත කිරීම

වන්දනා කරුවන්, වෙළෙන්දන්, රහසිගතව මුණ ගැසීම, (අකබා ගිවිසුම)

* ප්‍රධානීන්ව යැවීම

මුස්අබ් ඉබ්නු උමෛර් රළියල්ලාහු අන්හු තුමා මදීනාවට යැවීම.
වෙනත් ප්‍රදේශයන්ට සහාභාවරුන් හිජ්රත් යවන ලදී.

මදීනාවේ

1). හිජ්රත් සමාජ සංවිධාන
2). ගිවිසුම් (මදීනා ශාසනය, හුදෛබියා ගිවිසුම, නජ්රාන් ප්‍රදේශයේ යුදෙව් සමග වූ ගිවිසුම් යුද්ධ නියෝජිත කණ්ඩායම්)
3). නියෝජිත කණ්ඩායම්
4). කැඳවුම් ලිපි

## 8.3 සමාජ පරිසර වෙනස්වීම්වලදී උද්ගත වන ප්‍රශ්න සුහදව නිරාකරණය කර ගනිමු.

- ප්‍රශ්න නොමැති තැන් නැත. එය සුහදව විසඳා ගැනීමට දැනගත යුතුයි.
- මුස්ලිම්වරයා අන් අයවද ගරු කරන පුද්ගලයාය.
- ප්‍රශ්න විසඳීමට ගන්නා පියවර අහිතකර ප්‍රතිඵල සිදු නොකළ යුතුයි.
- ප්‍රශ්න විසඳීම මුස්ලිම්වරයකුගේ යුතුකම වේ.

මෙම ලෝකය මැවූ අල්ලාහ් විවිධ වර්ගයේ මැවීම මවා ඇත. ජාතීන් වශයෙන් හා ගෝත්‍රයන් වශයෙන් මැවූ අල්ලාහ් එකිනෙකා හඳුනාගැනීමට ඔහු ක්‍රියා කරන්නේ ය.

"يَا أَيُّهَا النَّاسُ إِنَّا خَلَقْنَاكُمْ مِنْ ذَكَرٍ وَأُنْثَى وَجَعَلْنَاكُمْ شُعُوبًا وَقَبَائِلَ لِتَعَارَفُوا إِنَّ أَكْرَمَكُمْ عِنْدَ اللهِ أَتْقَاكُمْ إِنَّ اللهَ عَلِيمٌ خَبِيرٌ"

"මිනිසුනි! නිශ්චිත වශයෙන් ම ඔබව පිරිමියෙකුගෙන් සහ ස්ත්‍රියෙකුගෙන් මැව්වෙමු. ඔබට එකිනෙකා දැන ගැනීම පිණිස අපි ඔබව ජාතීන් හා ගෝත්‍රිකයන් කළෙමු. නිත්‍ය වශයෙන් ම අල්ලාහ් ගේ සන්නිදානයෙහි ඔබ අතරින් ඉතා ගෞරව ඇති තැනැත්තා ඉතා භක්තිවන්ත ය." (49:13)

මෙම වාක්‍ය මිනිස්සු එකම මවගේ දරුවෝ බව පවසයි. එමනිසා මිනිසා තමන් කැමති ආගම අනුගමනය කළත්, කිනම් සමාජයක් වුවත්, එකම පවුල යන හැඟීමෙන් ජීවත් විය යුතු ය. මිනිසෙකු වශයෙන් අවශ්‍යතාවයන් එක ම වේ. ජීවිත රටාව පහසුකම් වෙනස් විය හැකි ය. එය ක්‍රමවත්ව ළඟා කර ගත යුතුයි. අන්‍ය අයට අපරාධ නොකර, අවශ්‍යතාවයට උදව් කර උපකාරීව සිටීම අපගේ ආගම පවසන අගනා දේශනාව වේ.

ලංකාව විවිධ ජාතීන් සහ සමාජයන් ඇති රටකි. ඔවුනොවුන්ගේ සමාජ සංස්කෘතික හා හැසිරීම් එලෙසම කිරීමට ඉඩ ඇත. මෙම තත්වයේ මුස්ලිම්වරුන් වන අපට අපේ ආගමේ දේශනා කළ පරිදි යහපත් ගුණ දහම අත්පත් කර ගත යුතුයි. අන් සමාජයේ අය අපව වැරදිව තේරුම් ගන්නා අයුරින් අපි හැසිරිය යුතු නොවේ.

" ولا يجرمنكم شنآن قوم على أن لا تعدلوا اعدلوا هو أقرب للتقوى "

කිසිදු සමාජයක් කෙරෙහි ඔබගේ ක්‍රෝධය ඔවුන් අසාධාරණ කිරීමට නොපෙළඹේවා! සාධාරණය ඉටු කරවු. එය භක්තියට ඉතා සමීපය. අප අවට ස්ථානවල අන්‍යයෝ වාසය කරති. ඔවුන් ගේ හැඟීම් උසිගන්වන අන්දමට අප හැසිරිය යුතු නොවේ. ඔවුන්ගේ හැඟීම් වලට ගරු කරමින් හැසිරිය යුතුයි. උදහරණයක් වශයෙන්

හජ් උත්සව දිනයේ දී එය අප විනීතව ඉටු කිරීමට වග බලා ගත යුතුයි. කැපීමට අපි ගෙනෙන එළුවන් සහ ගවයන් පාර දිගේ ම ඇද ගෙන යාම සහ පාර අයිනේ බැඳ තැබීම ද අන්‍ය ජන වර්ගයේ අයට නොයෙකුත් හිරිහැර ඇති කෙරේ. එපමණක් නොව කපන ලද සතාගේ අපද්‍රව්‍ය සැමතැන ම විසිකිරීමත් කොතරම් වැරදි දැයි අප බැලිය යුතුයි. අපගේ මෙවැනි ක්‍රියාවන් දකින අන්‍යයන් කෝපයට පත් කරන්නේ ය. පසුව එනිසා සමාජයන් දෙක අතර ප්‍රශ්න ඇති වීම අපි දකින්නෙමු. මෙම තත්වය ඇති විය යුත්තේ ඇයි? අප අපට පවසන ලද දේශනය අත් හැරීම නිසා වේ.

මෙවැනි නොයෙක් අවස්ථාවල දී අප කල්පනා කොට ආගමික සීමාව තේරුම් ගෙන හැසිරිය යුතුයි. පහර දීමෙන් මිනිස් ජීවිත විනාශ වේ. සාකච්ඡා කිරීමෙන් ඉස්ලාමය බොහෝදුරට යහගුණයන් පිළිබඳ අවධාරණය කර ඇති බව මීට පෙර ඉගෙන ගෙන ඇත. ඒවා අනුගමනය කිරීම තුළින් ප්‍රශ්න මතු නොවේ.

මුස්ලිම්වරුන් වන අප අතරේ ද සමහර අවස්ථා වල ප්‍රශ්න ඇති වේ. එය හඳුනාගෙන විසඳීමට උත්සාහ කිරීම ප්‍රඥාවන්ත වේ. මුස්ලිම්වරු අතර විවිධ සංවිධානයන් ඇත. ඒවායින් සමහරක් ආගමික කරුණු ද, තවත් සමහරක් සමාජීය කරුණු වලට ද යොමු වී කටයුතු කරති. ඒවා අතර උද්ගත වන ප්‍රශ්නයන් නිසියාකාරව විසඳා ගැනීමට උත්සාහ දැරිය යුතුයි. අපක්ෂපාතීව සමහරු මැදිහත් වී ඒවා සුහදත්වයකට පත් කළ යුතුයි.

ආගමික දෙයක් නම් මුස්ලිම්වරුන් විසින් එය විසඳාගත හැකි ය. අපේ රටේ 1924 වර්ෂයේ සිට සමස්ත ලංකා ජම්ඉය්යතුල් උලමාවේ ආගමික විසඳුම් අංශය මඟින් විසඳුම් ලබා ගත හැකිය. අප කවදත් එවැනි දෙයක් ව්‍යාප්ත නොවන සේ බලාගත යුතුයි. සාධාරණව ක්‍රියා කළ යුතුයි.

" وَأَقْسِطُوا إِنَّ اللَّهَ يُحِبُّ الْمُقْسِطِينَ "

"ඔබ සාධාරණය ඉටු කරනු! නිශ්චිතව ම අල්ලාහ් සාධාරණය ඉටු කරන්නවුන් ප්‍රිය කරන්නේ ය." (49:09)

ප්‍රශ්න දේශපාලන ආශ්‍රිතව නම් එයට සම්බන්ධව පාක්ෂිකයින් ගේ ඉහළ මට්ටමේ අය සමග මේ පිළිබඳව සාකච්ඡාකර විසඳා ගත යුතුයි. අන්‍ය සමාජයට ආදර්ශවත් සමාජයක් ලෙස අපව මවා ඇති බව අල්ලාහ් පවසා ඇත. එය සමාජයේ සහජීවන මාර්ගය වේ.

### අභ්‍යාස

(1). ඔබේ ගමේ ඇති වූ ප්‍රශ්නයක් ඔබ සුහදව විසඳුවේ කෙසේ ද යන්න පිළිබඳ රචනයක් ලියන්න.

(2). බහු ජාතීන් සමඟ ජීවත් වන අප හැසිරිය යුතු වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ලියන්න.

(3). නිවැරදි වාක්‍යය ලකුණු කරන්න.

1. අල්ලාහ් පළමු මිනිසාව මැටි වලින් මැව්වේ ය.
2. සමාජයන් හා ජාතීන් ආදිය සටන් කිරීමට මවන ලදී.
3. ආගමික ප්‍රශ්නවලට අප පොලිස් ස්ථාන වලින් විසඳුම් ලබා ගත යුතු ය.
4. අන් ජනවාර්ගිකයින් සමඟ අවබෝධයෙන් සහ මිත්‍රත්වයෙන් ජීවත් විය යුතුයි.
5. අන් අයගේ හැඟීම්වලට අප ගරු කළ යුතුයි.

## 8:4 ඉස්ලාමීය මානව අයිතිවාසිකම්

- මානව අයිතිවාසිකම් කුමක් ද? යන්න තීරණය කර ගැනීම.
- ඉස්ලාමීය මිනිස් අයිතිවාසිකමේ දයකත්වය.
- ඉස්ලාමීය මිනිස් අයිතිවාසිකම් පිළිබඳ අල්කුර්ආනය ලබා දී ඇති වැදගත්කම.
- අයිතිවාසිකම් රැකීම තුළින් එකමුතුකමේ උල්පතය.

සෑම මිනිසෙකු ම ගර්භාෂයෙන් උපදින විට, ජාති, ආගම්, භේදයෙන් තොරව "ළදරුවන්", යන නාමය සමඟ උපත ලබයි. නමුත් සෑම මිනිසා ම සිය කැමත්ත අනුව ජීවත්වීමට පෙළඹෙනවිට විවිධ ප්‍රශ්න උත්ගතවීමට පටන් ගැනේ.

මිනිස් අයිතිවාසිකම් යනු මිනිස් ජීවිතයේ සියලු ම අංගයන් අන්තර්ගතවන එක් පුළුල් කරුණකි. මෙහි තනි පුද්ගල මිනිස් අයිතිවාසිකම්, සමාජීය අයිතිවාසිකම් ද අන්තර්ගතය.

සංක්ෂිප්තව පවසන විට මිනිස් අයිතිවාසිකම් යනු මිනිසෙක් ඉපදුනු ද සිට මැරෙන තාක් කල් නිදහස්ව ගෞරවයෙන් භුක්තිවිඳගෙන ජීවත්වෙන අයිතිය ලෙස සඳහන් වේ.

එම නිසා ඉස්ලාම් පහත සඳහන් පරිදි පවසයි. "සෑම මුස්ලිම්වරයෙක් ම ඉපදුනුවිට, මිනිසා ජීවත්ව සිටින කාලයේ ඔහුට විවිධ දායාදයන් ලැබේ. එම නිසා අල්ලාහ් විසින් ලබා දෙන ලද මෙම දයාදයන් පිළිබඳ අධ්‍යයනය කර ඒවායින් ලැබෙන ප්‍රයෝජනයද ප්‍රතිඵල ලැබෙන අයිතිය මිනිසාට හිමි ය." යනුවෙන් පැහැදිලි කර, මිනිසාට අල්ලාහ් විසින් ලබා දී ඇති මෙම උතුම් දායාදයෙන් සාධාරණ ක්‍රමයට හා ආගමික සීමාවන් තුළ භුක්තිවිඳීමේ අයිතිය ඉස්ලාම් ලබා දී ඇත.

ඉස්ලාමය මිනිස් අයිතිවාසිකම් ඉතා අගය කරයි. ඉස්ලාමයේ සාකච්ඡාවලට ලක්වෙන අයිතීන් අල්ලාහ් විසින් ලබාදෙන ලද අයිතිවාසිකම් වේ. සමාජයක් සමඟ ඇසුරු කරන විට මේවා පහත සඳහන් පරිදි සැලකීම අවශ්‍යවේ.

### 1. පණ ඇති වස්තූන් ආදියට ඇති වගකීම

අවසන් හජ් අවස්ථාවේ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මෙලෙස පවසා ඇත. අල්ලාහ්ව ඔබ මුණ ගැසෙන අවසාන දිනය දක්වා කෙනෙකු සෙස්සන්ගේ සතුන් සහ පණ උදුරා නොගත යුතු ය.

(මුවත්තා)

## 2. මිනිස් ගරුත්වයට ඇති වගකීම

විශ්වාසවන්තයිනි,
1. කෙනෙකු, තව කෙනෙකුට විහිළු නොකරන්න.
2. නින්ද නොකරන්න.
3. විකට නම් යොදා නින්ද නොකරන්න.
4. කේළම් නොකියන්න. බාල්දු කර කථා නොකරන්න. (49.11.12)

## 3. ආගමික හැඟීම්වලට ආරක්ෂාව

" لا إكراه في الدين "

ආගමේ කිසිදු බල කිරීමක් නොමැත (2.256) යන්න අල් කුර් ආනයේ දේශනය වේ. ඉස්ලාම් යනු අල්ලාහ්ගේ ආගම සත්‍යය ආගමක් ලෙස පැවතුනත් අන් අයගේ ආගම නින්ද කිරීමට හෝ අවමානයට ලක් නොකළ යුතු යැයි ඉස්ලාමයේ අණ වේ. මෙවැනි සියලුම අයිතීන් ආරක්ෂා කරයි. නීතිය හමුවේ සියලුම අය සමානයි යනුවෙන් සැලකේ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් හඳුන්වා දුන් ප්‍රඥප්තිය මගින් සියලු වාර්ගික විරෝධතා අඩුකරන ලද අතර, සියලුම අයට සමාන සිවිල් අයිතීන් ලබාදෙන ලදී.

මේ නිසා සැම කෙනෙක්ම තම තමන්ගේ ආගමට අනුව, අනුගමනය කිරීමට; සම්පූර්ණ අයිතිවාසිකම් ලබා දී ඇත. එහෙත්, වැරදි කරන කාට හෝ වේවා දඬුවම් ලබා දෙනු ලැබේ. යන්නත්, වැරදිකරන අයගේ ඥාතීන්ට අනුකම්පා නොදැක්විය යුතු ය. යන්නත් සඳහන් කර ඇත.

ඉස්ලාමීය සමාජ ක්‍රමයේ ද, පාලනයේ ද මිනිසාගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු බවත්, වගකීම් ඉටු කරදිය යුතු බවත් සාධාරණ ලෙස නීතිය ක්‍රියාත්මක කළ යුතු බවත් අල්කුර්ආනය පවසා ඇත. (4.58)

තවද, මිහිතලයේ වසන මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් වන පණ වස්තූන් සහ නම්බුව ආදිය ආරක්ෂාකිරීම මුස්ලිම් සමාජයේත්, ඉස්ලාමීය පාලකවරුන්ගේන් උතුම් වූ වගකීම වන බව අල්කුර්ආනනයේ මතයයි.

ඉස්ලාම් කුමන සාරධර්මයෙන් යුත් මිනිසුන් බිහිකිරීමට කැමති වන්නේ ද යත්, ඉස්ලාමයට ප්‍රිය වී එය ජීවන මාර්ගයක් ලෙස පිළිගැනීමට කැමති අය වන්නෝය.

තවද "අන් අයගේ අයිතිවාසිකම්වලට අත තබන තරමට ඔබ ආත්මාර්ථකාමී නොවන්න" යනුවෙන් ද "ඔබගේ සාධාරණ අවශ්‍යතාවයන් පවා ඉටු නොකර, සමාජවාදීන් ලෙස නොසිටින්න." යනුවෙන් ද ඉස්ලාමය පවසයි. එනම් තමන්ගේ යහපත පමණක්

සිතීමේ තත්ත්වයෙන් සහමුලින් ම ඉවත්ව නොසිට සාධාරණත්වයේ සිටිය යුතු බව ද අවවාද කරයි. ඉස්ලාමීය දැක්මේ මෙම ලෝකය යනු ඉතා වැදගත් එකකි. මක් නිසා ද යත්, මෙලොව ජීවිතය, ඉස්ලාම් මිනිසාට ඉතා උසස් අරමුණක් පිහිටුවා ලබා දී ඇත. මෙම අරමුණ මිනිසා ලඟා කරගැනීම පිණිස, ඔහු වෙත සමහර ස්වයං පාලනයක් පටවා ඇත.

සෑම මුස්ලිම් වරයෙකුට ම අල් කුර්ආනය සහ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ දේශනයන් සහ ආදර්ශ තිබිය යුතු ය. මේවා අනුගමනය නොකර සීමාවන් පැහැර හැරීමෙන් තම සමාජයේ විනය ශක්තිය වැඩි වශයෙන් බලපෑමට ලක් වේ. මේවායේ මග පෙන්වීම් නොමැති මිනිසෙකු තමන් සතු හැකියාවන් සම්පූර්ණයෙන් ම දියුණු කර ගත නොහැක. නමුත් ඉස්ලාමය සමාජ වගකීම්වලට වැදගත් තැනක් ලබාදේ. සෙස්සන්ගේ යහපත ආරක්ෂා කිරීම ද, අනිකුත් මැවීම සමඟ ආදරයෙන් යුතුව ශිෂ්ට සම්පන්නව හැසිරීමට ද, පොළඹවයි. සෑම කෙනකු ම පළමුව තමන්ගේ පවුලේ අය සමඟ නිසියාකාරව හැසිරීම අත්‍යවශ්‍යයි. පසුව අනිකුත් ඥාතීන්, අසල්වැසියන්, මිත්‍රයන් දන හඳුනන අනාථයන්, වැන්දඹුවන්, දුප්පතුන් සහ අනිකුත් මුස්ලිම්වරුන්, අනෙකුත් මිනිසුන්, සතුන්, කුරුල්ලන් මෙවැනි අල්ලාහ් විසින් මවන ලද මැවීම් සමඟ ද නිසියාකාරව හැසිරීමෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සෑම කෙනෙකුගේ ම යුතුකම වේ. ලෝකව්‍යාප්ත මට්ටමේ සියලු ම ජනතාව, කෙනෙකු කෙනෙකුට හිරිහැර නොකර, වහල්නොකර තමන් නිදහස්ව, ගෞරවාන්විතව ජීවත්වීමට සිතීම මෙන් ම, අනිකුත් අය ද ජීවත්වීමට ඉඩ සලසා දිය යුතු ය. අප ලබාගත් ප්‍රීතිය මෙම ලෝකයේ සියලු දෙනාට ම ලැබිය යුතුයි යන අරමුණින් සෑම මිනිසෙකුම ඒ ගැන සිතා ජීවත්වීමට පටන්ගන්නා විට ස්ථිර වශයෙන් ම තමන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳගෙන නිදහස්ව ජීවත් විය හැක. තවද මෙම ලෝකයේ නිදහස සහ සාධාරණත්වය හා සාමය උදාවීමට ද මිනිස් සමාජයේ සියලුදෙනාට ම මිනිස්කම ද අයිති විය යුතු ය.

ඉතිහාසයේ සෑම මිනිසෙකු ම නිදහස්ව ඉපදෙන්නේ ය. නමුත් මෙම ලෝකයේ ජීවත්වීමේ නිදහස සහ සන්සුන්ව සිටීමේ අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබේ. මෙලෙස අයිතිවාසිකම් නැති වූ අය නොයෙකුත් කරදරයන්ට භාජනය වේ. තවද ම්ලේච්ඡ ක්‍රියාවන් නිසා ද බලපෑම්වලට ලක්වේ.

සැමදම මිනිසුන් අයිතිවාසිකම් පැහැර හැරීම නිසා ඇත්වීගෙන යයි. නිවසින් පිටවී ගිය මිනිසා ආපසු නිවස බලා ඒම නිශ්චිත වශයෙන් කිව නොහැකි ය. හැරෙන, හැරෙන දිසාවල වෙඩි උණ්ඩ විසි වෙයි. බෝම්බ, ග්‍රැනයිට් බිම් බෝම්බ පුපුරයි. පණ අත කෙළවරේ ගෙන අද මිනිසා පසුතැවිලි වෙයි. මෙය අද ලෝකයේ තත්වය ලෙස දැකිය හැක. මෙම තත්වයට හේතුව කුමක් ද? යන්න පැහැදිලිව තේරුම් ගත හැකි ය.

ඉස්ලාමීය මූලිකත්වයෙන් මිනිසුන් සියලු දෙනා ම සමානය. සම අයිතිවාසිකම් හිමි බව සිතා ජනතාවගේ ජීවිතය ආරක්ෂා කිරීමටත්, සශ්‍රික කිරීමට ද බොහෝ අවස්ථා තිබියදීත් කිසිවක් කිරීමට උනන්දුවක් නොදක්වන තත්වයේ සිටිම ලැජ්ජා විය යුතු කරුණකි.

ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තීන් දියුණුවී තිබෙන මෙම අදියරයේ මිනිසා තමාගේ කල්පනා ශක්තියෙන් නවතම දුෂ්ටකම් සෙස්සන්ට කිසිදු භයකින් තොරව කිරීම ඉතා ශෝකය ඇති කරන කරුණකි. එම නිසා අද ලෝකයේ මිනිස් අයිතිවාසිකම් යන වචනයට තැනක් නැත. ඒකාධිපතික ම ස්ථිරව ම පවතී. අද ලෝකයේ භයංකර තත්වයෙන් වෙනසක් දැකීම සියලු දෙනාගේ ම යුතුකමකි.

ජාතීන් ඒකරාශී කර දේව විශ්වාසය ඇතිකර ගත යුතු ය. මිනිසාගේ විශ්වාසය, අදහස, චින්තනය ආදිය විධිමත් කිරීම තුළින් ඔහුගේ වචනය ක්‍රියාව හා හැසිරීම නිසිපරිදි කළ හැකි ය. මිනිසාගේ සිතේ දේව විශ්වාසය ඇතිවීමෙන් පසු, හැසිරීම විධිමත් කිරීමට එළඹෙන නිසා සෑම මිනිසෙක් ම තමන්ගේ හැසිරීම පිළිබඳව අල්ලාහ් වෙත පිළිතුරු දිය යුතුය යනුවෙන් ඔහුට හැඟෙන්නේ ය. මෙම පදනම මත මුස්ලිම්වරයෙකු කවදත් අවංකව සහ යුක්තිගරුකව හැසිරීම ඉස්ලාමයේ ඉතා වැදගත් තැනක් ලබා දී ඇත.

"සමාජයේ සමස්ත විනය පාලනය යනු එහි සාමාජිකත්වය දරණ තනි මිනිසෙකුගේ විනයෙහි උසස්කම නිසා ම එය පිහිටයි," යන්න ඉස්ලාමයේ ප්‍රතිපත්තිය වේ. එලෙස ම ඉස්ලාම් සමාජයේ එක් එක් සාමාජිකයින්ට හිමි ගෞරවය ලබා දෙයි. සෑම කෙනෙකුගේ ම අයිතිවාසිකම් ඉතා පැහැදිලිව නිර්ණය කර ඇත. තනි මිනිසා ආත්මාර්ථයෙන් පොළඹවා සෙස්සන්ගේ අයිතිවාසිකම්වලට අත තැබීමට ඉස්ලාම් දඬුවම් කරයි. එලෙස ම සාමාජය තනි පුද්ගලයෙකුගේ අයිතිවාසිකම උදුරාගැනීමට ඉස්ලාමය විරුද්ධවේ. නියත මුස්ලිම්වරයෙකු තමන්ගේ විනය සහ සමාජයේ හිමි ස්ථානය ලබා ගනී. එසේ ම නිශ්චිතව ම මුස්ලිම්වරයෙකු සමාජයේ විනය පාලනය කිසිසේත් කැඩී යෑමට නොදී ආරක්ෂා කර ගනී.

මෙලෙස ඉස්ලාමයේ තනි මිනිසා තමන් පාරිශුද්ධ කරගැනීමට වගබලාගනී. ඔහු සාමාජයේ එක් අංගයක් ලෙස ජීවත්වෙමින් තමන් ශුද්ධවන්තයෙකු ලෙස සකස්කර ගනී. ඔහු තමාව ශුද්ධවන්තයෙකු කිරීමට ගන්නා පියවර, සමාජයේ එවකට උද්ගතවන පරිහාණිය ද නැති කරයි. මෙය ඉස්ලාමයේ ප්‍රවේශ මගක් වේ.

සමාජයේ හොඳ දේවල් ඉටුකරන ලෙසත් නරකදේ නොකරන ලෙසත් මෙවැනි කාර්යවල නිතර එක් කොටසක් නියැළී සිටිය යුතු බවත්, ආගමික නීති මාර්ගය ඉගෙනගන්නා කාර්‍යයේ නියැළෙන එක් කණ්ඩායමක් ද සිටිය යුතු බවත් අල් කුර්ආනය විග්‍රහ කරයි. මුස්ලිම් සමාජයේ බෙදීම් සහ දෙදරීම් ඇති නොවන ලෙස, සමාජයේ එකමුතුකම ආරක්ෂා කිරීම ඉස්ලාමීය පාලකවරුන්ගේ සහ මුස්ලිම් සමාජයේ පවිත්‍ර වූ කාර්යයන්ගෙන් එකක් වේ. එමනිසා සියලුදෙනා ම ඉස්ලාමීය මිනිස් අයිතිවාසිකම් ආරක්ෂාකර, සාමය සහ එකමුතුකම ආරක්ෂාකිරීමට ද ඉදිරිපත් වෙමු.

**කෙටි පිළිතුරු සපයන්න.**

1). මිනිස් අයිතිවාසිකම් යනු කුමක්ද?

2). ඉස්ලාමීය මිනිස් අයිතිවාසිකම් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

3). මිනිස් අයිතිවාසිකම් පිළිබඳ අල්කුර්ආනය, සහ අල්හදීස් පවසන කරුණු ලියන්න.

4). ඉස්ලාම් බිහිකිරීමට අපේක්ෂා කරනු ලබන්නේ කවර ගුණාංගයන්ගෙන් හෙබි පුද්ගලයෙක් දැයි සටහන් කරන්න.

**පැවරුම්**

1). මිනිස් අයිතිවාසිකම් සම්බන්ධ ව ඉස්ලාමීය දේශනයන් ගැන විමසා කරුණු සපයන්න.

2). ඉස්ලාම් අනුමත කර ඇති මිනිස් අයිතිවාසිකම් අද ලෝකයේ කෙතරම් භාවිතයේ පවතින්නේ දැයි විස්තර කරන්න.

## 8.5 මනෝ විද්‍යාව සහ ඉස්ලාමය

- "ඉස්ලාමයේ මනෝ විද්‍යාවේ වැදගත්කම" මේ තුළින් ඉස්ලාමීය සමාජය විනයගරුකයින් ලෙස සිටී.
- ඉස්ලාමයේ මනෝ විද්‍යාවේ වැදගත්කම පිළිබඳ අල්කුර්ආන් වැකි මගින් දැනගැනීම.
- ඉස්ලාමය ශරීර සෞඛ්‍යය මෙන් ම මානසික සෞඛ්‍යය ද වගබලා ගන්නේ ආගම යන්න දැනගැනීම.
- එක් මිනිසෙකුගේ ජීවිතයට මනෝ විද්‍යාව අත්‍යවශ්‍ය බව පෙන්වා දීම.

මවගේ ගර්භාෂයේ බිහි වෙන ජීවය ලෝකයේ ඉපදී ජීවත් වේ. දවසින් දවස වෙනස් වන මෙම ලෝකයේ එම ජීවයේ හැසිරීම් ද පරිවර්තන වී යයි. ඒ ලෙස වෙනස් වන හැසිරීම් වල ස්වභාවයන් විස්තරකර දෙන්නේ මනෝ විද්‍යාවයි. විශේෂ ප්‍රබෝධය, සිනාව, ඇඬීම, සතුට සහ හැඟීම ආදිය පිළිබඳවත් මනෝ විද්‍යාව පැහැදිලි කරයි. මනෝ විද්‍යාව වනාහි මිනිසාගේ, අනෙකුත් ජීවීන්ගේ හැසිරීම අධ්‍යයනය කරන විද්‍යා ක්‍රමයේ එක් අර්ථයක් වේ.

මිනිසාගේ එදිනෙද ජීවිතයේ සෑම අංගයක ම මනෝ විද්‍යා අංශයන් එළිදරව් වේ. සෑම මිනිසෙකු ම තමන්ට හිමි ආකල්පයට අනුව ජීවත් වේ. ඔහු සමාජය සමඟ ආශ්‍රය කරන විට සහ කෙනෙකු සමඟ තනිව ආශ්‍රය කරන විට ඇතිවන ආකල්පය ද වෙනස් වේ.

කෙනෙක් සමාජය සමඟ ආශ්‍රය කරන අවස්ථාවේ සමාජය ඔහුගේ ආකල්පය තක්සේරු කරයි. මනෝ විද්‍යාව විවිධ ස්වභාවයන්ගේ සම්පාදනයක් දැකිය හැකි ය.

එම නිසා සෑම මිනිසෙකුගේ ම චිත්ත ප්‍රබෝධය හැසිරීම් සේ එළි දැක්වේ. පාරිශුද්ධත්වය එක් මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ ඉතා වැදගත් ය. එක් මිනිසෙකුගේ ජීවිතයේ දැකිය හැකි ක්‍රියාකාරකම් සියල්ල ඔහුගේ අදහස්වලට අනුව සැකසේ. "එක් මිනිසෙකුගේ සිතුවිල්ල පාරිශුද්ධව තිබේ නම්, හැසිරීම විධිමත්ව සෑදේ. මේ නිසා ජීවිතය අලංකාර වේ" යනුවෙන් ඉස්ලාමය පවසා ඇත.

" إنما الأعمال بالنيات "

"ක්‍රියාවන් සියල්ල ආකල්පවලට අනුවම වේ." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පවසා ඇත. (බුහාරි, මුස්ලිම්)

මිනිසෙක් යමක් සිතනවා ද එහි ප්‍රතිඵලය ඔහුට ලැබේ. අල්ලාහ්ගේ තෘප්තිය සහ ආදරය ද රසුල් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ව අනුගමනය කිරීමේ හැඟීම පමණක් කෙනෙකු ගේ හොඳ ක්‍රියාවන්ට රුකුලක් වීමක් ලෙස සැකසෙන විට ඒවා අල්ලාහ් විසින් අනුමත කරනු ලැබේ.

ඉස්ලාමීය ජීවන රටාව සෑම කාලයකට ම ගැළපේ. මිනිසෙක් උපන්දාසිට මරණය දක්වා ම ජීවත් විය යුත්තේ කෙසේ ද,? කුමන ක්‍රියාකාරකම් ද කළ යුත්තේ යනුවෙන් ඉස්ලාමය දේශනා කරයි. එමනිසා මිනිසාගේ දියුණුවන අදියර වලට සහ ක්‍රියාකාරකම් වලට අනුව, වගකීම් ද නියම කර ඇත. වැසීමේ රූපයෙන් ප්‍රතිබිම්බ වන ක්‍රියාකාරකම් ගැන ද සීමා කර පවසා ඇත. මෙකී විෂයන් පිළිබඳ ළමයින්ට පුහුණු කිරීම ඉතා වැදගත් කාර්යයකි. දරුවන් හදවඩා සදචාරාත්මක කිරීම දෙමව්පියන්ගේ වගකීමක් වේ. පොඩිත්තන්ගේ සිත ඉතා පිරිසිදුය. ප්‍රත්‍යක්ෂය, කිසියම් අදහස් පිළිගන්නා ස්වභාවයක් ඇත. යම් දෙයක් එහි වැපිරිය හැක. හොඳ ක්‍රියාවන් වැපුරුවේ නම්, මෙලොව පරලොව දෙකෙහිම ඔහුට ජයග්‍රහණය ලඟා කරගත හැකි ය.

මේ අයට ලබා දෙන ලද ප්‍රසාදයන්හි ඔවුන්ගේ දෙමව්පියන්ට ද කොටසක් හිමි වේ. දෙමව්පියන්ට පමණක් නොව ගුරුවරුන්ට ද හිමි ය.

" يا أيها الذين آمنوا قوا أنفسكم وأهليكم نارا "

"විශ්වාසවන්තයනි! ඔබ සහ ඔබගේ පවුලේ අය නිරයේ ගින්නෙන් ආරක්ෂා කර ගන්න!" (66:06) යනුවෙන් අල්ලාහ් පවසයි. 'පොඩිත්තන්ගේ සිත් තුළ පිරිසිදු චින්තනයන් ඇති කළ යුතු ය. නරක අය සමඟ ආශ්‍රය කිරීමට ඉඩ නොදෙන්න. නරක පුරුදු වලට අවසර නොදිය යුතු ය. මෙලෙස වැරදි සිදුවුවහොත් ඔහුගේ ජීවිතය පුරාම නාස්ති වේ. වැඩීමෙන් පසුව වැරදි ඔහුට තේරුම්ගත නොහැකි ය. එම නිසා කුමන පුහුණුවක් හෝ කුඩා අවධියෙහි ම සිතෙහි තැන්පත් කළ යුතු ය'.

කුඩා දරුවන් වැඩී, අදහස් තේරුම් ගැනීමේ අවධියට පත්වන විට, යහපත් සාරධර්මයන් ඔවුන්ගේ සිත්වලට යොමු කළ යුතුයි. පාසල් අවධියේ අල්කුර්ආනය, නබිවරයාගේ උපදෙස්, විශිෂ්ට අයගේ ඉතිහාසය, දිනපතා උසුරන "දුආ" මෙලෙස දේශනා කළ යුතුයි. අනිවාර්යෙන් ඉටු කළ යුතු පාරිශුද්ධත්වය සලාතය වැනි කරුණු වල ඔවුන්ගේ අවධානය යොමු කළ යුතුය. මෙලෙස ආරම්භයේ සිට ඉස්ලාමීය සාරධර්මවලට අනුව වැඩෙන දරුවන් පාරිශුද්ධත්වයෙන් ජීවත් වීමට ඉගෙන ගනී. මෙලෙස ඉස්ලාමීය සමාජයක් බිහිකල හැකි ය. නබිවරුන් සියලු දෙනාම උසස් සාරධර්ම ඇත්තෝ ය. ඔවුන්ගේ සිත් දිය ඇති ඇළට වඩා පැහැදිලිය. ඒවායේ කුණුවලට ඉඩ නැත. මලකඩ බැඳීමට මාර්ගයක් ද නැත. මෙවැනි ගතිගුණ වල නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ස්ථිර ලෙස පිහිටියේ ය. එපමණක් නොව, ඔවුන්ව අනුගමනය කළ බුද්ධිමතුන්, නීති විශාරදයන්, උත්තමයන් සියලුදෙනා ම ගුණාංග වලින් පිරී සිටියහ. යහපත් ගුණාංග ලබා තිබීම ආගමට ඉතා වැදගත් කරුණකි. මෙවැනි යහපත් ගතිගුණාංගයන් සකසා ගැනීම පිණිස, දේවභක්තියෙන් යුත් අය රෑ දවල් නොබලා ඇදහීම් වල නිරත වූහ. දේව කාරුණික ඇත්තන් මානසික අභ්‍යාස වල නිරත වූහ. " මානසික අභ්‍යාස වල උපකාරයෙන් යහපත් ගතිගුණයන් ද උසස් සාරධර්මයන් ද ඇති කර ගත හැකි ය" යනුවෙන් තමාගේ පරමාර්ථය ද ලඟාකර ගත්හ.

නරක ගුණය මිනිසාගේ හතුරාය. නරක ගුණය අල්ලාහ් ගේ දයාවට ඉතා ඈත් වූවකි. මෙය ශරීර රෝගයට වඩා නපුරුය. එය පරලොව ජීවිතය විනාශ කරයි.

නීරෝගීමත් කෙනෙකු තම නීරෝගිකම ආරක්ෂා කිරීමෙහි එම කරුණුවලට දැඩි උනන්දුවක් දක්වයි. අසනීපව සිටින කෙනෙකු නිරෝගිමත් කරුණුවලට උනන්දුව දක්වයි. මෙලෙසම පාරිශුද්ධත්වයෙක් එම පාරිශුද්ධත්වය ආරක්ෂා කර ගනියි. මානසික රෝගියෙකු නිරෝගිකම ඇතිකර ගත යුතු වේ. එමෙන්ම නරක දේවල් කිරීමෙන් විනාශ වී යා හැකි ය. මෙලෙස පුහුණුව ලබාදීමෙන් නිරෝගිකමත් සමඟ පාරිශුද්ධත්වය ද ලබා ගත හැකි ය.

"විශ්වාසය ජීවිතය වේ" යන පදනම මත විශ්වාසය යනු අදහස ද, චින්තනය ද විධිමත් කෙරේ. මේ නිසා හොඳ, නරක ආදිය වෙන්කර දැන ගැනීමේ විචක්ෂණ බුද්ධිය මිනිසාට පමණක් අල්ලාහ් විසින් ලබා දී ඇත. මෙම හේතුව නිසා මිනිසා අනෙකුත් මැවීම් වලට වඩා විශිෂ්ට හා උසස් බවට පත් වේ. විචක්ෂණ බුද්ධිය නිවැරදි යනුවෙන් පවසන දෙය නොකරන ලෙස බාධා කරයි. වැරදි යනුවෙන් පවසන දෙය කරන ලෙස පොළඹවයි. මේ පිළිබඳ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මෙලෙස පවසා ඇත.

"නිශ්චිත වශයෙන් ම ශරීරයේ එක් මස් වැදැල්ලක් ඇත. එය විධිමත් වූවානම් සම්පූර්ණ ශරීරය ම විධිමත්ව පවතී. එය නරක් වූවානම් සම්පූර්ණ ශරීරයම නරක් වේ. එය තමයි සිත." (බුහාරි, මුස්ලිම්)

සිත පිරිසිදු කිරීම තුළින් මිනිසාව පිරිසිදු කිරීමේ කාර්යය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් භාරගත්තේ ය. නබි තුමාණන්ව දූතයෙකු, රසූල්වරයෙකු ලෙස යැවීම පිළිබඳව අල්ලාහ් පහත සඳහන් පරිදි පවසයි.

"ඔහු ඔහුගේ වාක්‍යයන් ඔහුට ආයතයන් හදරවා දී ඔහුව පවිත්‍ර කර (රසූල්වරයා) පුස්තකය ද, නුවණ ද, උගන්වන්නේ ය. (62.2) හිත පිරිසිදුවීමෙන් මිනිසා උසස් තත්වය ලඟාකර ගත හැකි ය. යනුවෙන් අල්කුර්ආනයේ විවිධ වාක්‍යයන් හදීස් ද අවධාරණය කරයි. යන්ත්‍රයක් මෙන් ම සිත ක්‍රියා කරයි. මෙය බොහෝ දුරට මිනිසාව නරක පැතිවලට හා නරක ආශාවන් පැත්තට පොළඹවන නිසා මෙය "නෆ්ස් අම්මාරා" යනුවෙන් ද පදම් වූ පාරිශුද්ධත්වයෙන් යුත් මිනිසා "නෆ්ස් මුත්මඉන්නා" යන්නෙන් ද අල්කුර්ආනය පවසයි. මෙලෙස නෆ්ස් ඇත්තන් ඉතා තෘප්තිමත්ව අල්ලාහ් වෙත යයි.

"තෘප්තිමත් (නෆ්ස්) ආත්මය ඔබ ඔබගේ දෙවියා වෙත ආපසු බලා යන්න. ඔහු ගෙන ඔබ තෘප්තිමත් වන්න. ඔබ පිළිබඳ ඔහු තෘප්තිමත් වෙයි. ඔබ මාගේ හොඳ අය සමඟ එකතු වී මගේ ස්වර්ගයට පිවිසෙන්න." (89 :27 : 30)

මෙවැනි අය මෙලොවේ තෘප්තිමත්ව ද සිත සන්සුන්ව ද ජීවත්වීමට පමණක් නොව පරලොව ද ප්‍රීතිය ලබා දෙන ස්වර්ගයට ලඟා කර ගනී. සිත පිරිසිදු කිරීම කෙතරම් වැදගත් දෙයක් ද යන්න මෙයින් තේරුම් කර ගත හැකි ය.

විශ්වාසය හා ස්ථිරත්වය කවදත් සිතේ තිබිය යුතු ය. අල්ලාහ් පිළිබඳව සම්පූර්ණයෙන් ම විශ්වාස කළ යුතුයි. සිතෙහි ඇති අහංකාරය, ආඩම්බරය, සැකය, ඊර්ෂ්‍යාව, මාන්නය, වංචාව, ක්‍රෝධය, වෛරය, සහ කෝපය ආදියෙන් සිත පිරිසිදු කර ගත යුතු ය.

"පරිසරය කෙනෙකුගේ මානසිකත්වයට බලපෑම් ඇති කරයි." යනුවෙන් මනෝවිද්‍යාඥයින් තහවුරු කර ඇත. නබිතුමාණන් ද පරිසරය ගැන පවසා ඇත. එම නිසා හොඳම පරිසරයක ජීවත්වීමෙන් හොඳ දේ ඇහුම්කන් දීමටත්, බැලීමටත් අදාළ අවස්ථාවන් ඇති කර ගත යුතුයි. මෙලෙස යහපත් අය සමඟ ආශ්‍රය කිරීම මෙන් ම දුෂ්ටයින් සමඟ ආශ්‍රය කිරීමෙන් වැළකී සිටිය යුතුයි. එම නිසා හොඳ පරිසරයන් යහපත් මිත්‍රයන්ගේ හොඳ සිරිත් පුරුදු වීම පාරිශුද්ධත්වයෙන් ජීවත්වීමට ද ඉතා අවශ්‍ය වේ.

තවද පාරිශුද්ධත්වය සමඟ ම එය ආරක්ෂා ද, කර ගැනීමට සලාතය වැනි අනිවාර්යය යුතුකම් නොවරදවා ඉටු කරන අතර, සුන්නත්, ඉබාදතයන්වල ද වැඩි උනන්දුවක් දැක්විය යුතු ය. මීට අමතරව අල්කුර්ආනය පාරායනය කිරීම, එහි දේශනාවන් තේරුම් ගැනීම, හොඳ ග්‍රන්ථයන් කියවීම යනාදිය ඉතා වැදගත් ය. තවද ඉස්තිඃෆාර්. තව්බා, දික්ර්, දුආ, ඉඃතිකාෆ් සහ තස්බීහ් කිරීම යනාදියේ ද අවධානය දැක්විය යුතු ය. මේ සියල්ල 'තස්කියා' යනුවෙන් පාරිශුද්ධත්වය ඇති කිරීමට ඉවහල් වේ.

## පැවරුම්

(1). ඉස්ලාමීය ශරීර සෞඛ්‍යය මෙන් ම මානසික සෞඛ්‍යය ආරක්ෂා කිරිමේ ආගම වශයෙන් මානසික සෞඛ්‍යය ආරක්ෂා කිරීම සහ එහි දේශනයන් විස්තර කරන්න.

(2). මිනිසා ලඟා කර ගැනීමේ දී මනෝ විද්‍යාව ආශ්‍රිත ක්‍රමයන් වැදගත් තැනක් ගනී, යන්න පැහැදිලි කර ලියන්න.

## 8.6 ආගමික අවබෝධතාව

- ඉස්ලාමය වෙනත් සමාජයන්ට ලබා දී ඇති ගරු කිරීම දැන ගැනීම.
- නොයෙකුත් ආගම් අතර එකමුතුකම ඇති කිරීමට ඉස්ලාමීය සිරිත් විරිත් හඳුන්වා දීම.
- සාමය යනු කුමක්ද යන්න ඉස්ලාමීය දේශනා මගින් හඳුන්වා දීම.
- ආගමික අවබෝධතාව තුළින් සාමය සමගිය වර්ධනය කිරීම.

සාමයට අකමැතිවූවන් කිසිවකු නොමැත. ඒ වෙනුවෙන් සියලු දෙනා ම උත්සාහ කරති. ජනතාව අතර ඇතිවූ භේද සහිත ප්‍රතිපත්තීන් සහ මතභේද සාමය සහමුලින් ම නැතිවීමට වැදගත් සාධකයක් වේ. ඒවා හඳුන්වාදී ඉස්ලාම් ආගම විනීතව දේශනා කර ඇත. සැම කෙනෙක් ම තම තමන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳගෙන ජීවත් විය යුතු බව ද එය යුතුකමක් ලෙස ද පවසා ඇත. මෙම හොඳ දේශනාවන් අනුගමනය කරන්නේ නම් ලෝකයේ සාමයෙන් පිරි සහජීවනයක් උදාවේ.

ඉස්ලාමය මුළු මහත් සමාජයට ම සුදුසු ආගමකි. මෙහි දේශනයන් ඉතා සරල ය. සියලු දෙනා විසින් අනුගමනය කළ හැකි එකක් වේ. මෙය විශ්වාසය, ඇදහිලි යනාදිය දේශනා කරන අතර, මිනිස් ජීවිතය, සමාජ ජීවිතය සහ පවුල් ජීවිතය යනාදිය කෙළෙස පිහිටිය යුතු ද යන්න දේශනා කරයි. මුස්ලිම්වරුන් වන අපි එක් සමාජයක් ලෙස බැදී ජීවත් වෙමු.

භාෂාව, වර්ණය, රට, ජාතිය, සහ කුලය යනාදිය පදනම් කොට ගෙන වෙනත් සමාජයක් ලෙස බෙදීමේ ක්‍රමයක් ඉස්ලාමයේ නොමැත. සැම මිනිසෙකු ම අන් අය සමඟ සමගියෙන් හා එක්සත්ව ජීවත් වීම ඉස්ලාමය යුතුකමක් බව පවසයි. "මිනිසුන් සියලුදෙනාම සමානය" යනුවෙන් ඉස්ලාමය පවසයි. මෙය පදනම් කොට ගෙන එක් එක් සමාජ වලට නමක් තබා ඇත.

සියලු දෙනාගේ ම අභිලාශයන් මත ජීවත් වීම අවශ්‍යතාවන්ගෙන් එකක් ලෙස අවබෝධකර ඇත. සියලු දෙනාට ම පණ තිබේ. විචක්ෂණ බුද්ධිය ඇති "මිනිසුන් යනුවෙන් මිනිසාට මිනිසා විසින් කළ යුතු යුතුකම් ද මුස්ලිම්වරු වශයෙන් වෙනත් සමාජයන්ට ඉටුකළ යුතු යුතුකම් රාශියක් ඇත. ඒ අවස්ථාවේ අපි වෙනත් සමාජයට අයත් අය අතර කෙසේද සම්බන්ධකම් පැවැත්විය යුත්තේ? යන්නත් අපි දැන ගෙන සිටීම අත්‍යවශ්‍යවේ.

මිනිස්සු කුමන සමාජයකට අයත් වුවත්, කුමන ආගමකට අයත් වුවත් ලෝකයේ ප්‍රීතියෙන් ජීවත් වීමට මොනයම් අවශ්‍යතාවයන් තිබේ ද? යන්නත් ඒවා සියල්ල අනිකුත් සමාජයටත් ඉටු කරදිය යුතුම ය.

"අන් ආගමිකයන් සමඟ ආදරයෙන් සිටිය යුතු ය. උදවු උපකාර කර යුක්ති සහගතව හැසිරිය යුතුයි." යනුවෙන් අල්කුර්ආනයේ අල්ලාහ් විසින් අනුමත කර ඇතිබව පවසයි.

" يأيها الذين آمنوا كونوا قوامين لله شهداء بالقسط ولا يجرمنكم شنان قوم على ان لا تعدلوا اعدلوا هو اقرب للتقوى "

"විශ්වාසවන්තයිනි ! ඔබ අල්ලාහ් වෙනුවෙන් සත්‍යයේ ස්ථිර ලෙසත් නීතියට සාක්ෂි දරන්නෝ ලෙස ද පවතින්න. සමූහයක් කෙරෙහි ඔබට ඇති ක්‍රෝධය ඔබව අසාධාරණය ඉටුකිරීමට නොපැමිණිය යුතු ය ඔබ සාධාරණය ඉටු කරන්න. මෙය දේව භක්තියට ඉතා උචිතය," යන්න අල්ලාගේ අණක් වේ. (5:8)

" لاينهاكم الله عن الذين لم يقاتلوكم في الدين ولم يخرجوكم من دياركم أن تبروهم وتقسطوا إليهم إن الله يحب المقسطين "

එහෙත් ආගමික කරුණුවලින් ඔබට විරුද්ධව යුද්ධ නොකල නිවෙස්වලින් පිටමං නොකළ අයට ඔබ කරුණාව දක්වා ආනිසංස නොකරන ලෙස ද ඔවුන් සමඟ යුක්තිගරුකව නොහැසිරිය යුතු ලෙස ද අල්ලාහ් ඔබව අවහිර කර නොමැත. නියත වශයෙන් ම අල්ලාහ් සාධාරණය ඉටුකරන්නට ආදරය දක්වන්නේ ය.

(අල් කුර්ආන් )

ඉහත සඳහන් පරිදි අල්ලාහ් සහ තමාට අත්වැලදික්කර සිටින සහ අල්ලාහ්ගේ ජීවීන් වන වෙනත් සමාජයන් සමඟ විශ්වාසව හැසිරිය යුතු ලෙස ද මිනිස්කමට ගරු කර ඇත. කුමන ආගමට අයත් වුවත් (සමාජය) කුසගින්නේ සිටින අයට ආහාර දීම, පිපාසයෙන් සිටින අයට ජලය පෙවීම, අනතුරකට ලක්වූවන්ට උදව් කිරීම, දරිද්‍රතාවයෙන් ජීවත් වන අයට එය තුරන් කිරීමට පියවර ගැනීම යනා දී මෙවැනි උදව් මිනිසෙකු විසින් මිනිසාට ඉටුකළ යුතුව ඇත.

අන් සමාජයට අයත් කිසිවෙකුට සමහර අවස්ථාවල උපද්‍රවයන් කිරීමට තැත් කළත් අපගේ මිනිස්කම පෙන්වීමට අප පසු බට නොවිය යුතුයි. මෙවැනි අවස්ථාවල අප උසස්කමින් හැසිරීම නිසා ඉස්ලාමයේ විශේෂත්වය අන් ආගමිකයන් දැන ගැනීමට අවස්ථාව ලැබේ. අස්මා රලියල්ලාහු අන්හා බැලීමට ඇයගේ මව පැමිණියා ය. ඉස්ලාමය නොවැළඳගත් මව මාව බැලීමට පැමිණ සිටින බව පවසා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝගෙන් අවසරය ඉල්ලා සිටියහ. ඔබව බැලීමට පැමිණි කාෆිර් වන මවට උපකාර කර යවන ලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසුවේ ය.

ඉමාම් අබූ හනීෆා රහ්මතුල්ලාහි අලෛහි තුමාගේ අසල් වැසියා අන්‍ය ආගමිකයෙකි. ඔහු සංගීතඥයෙක් පමණක් නොව සංගීතය ප්‍රිය කරන්නෙක් ද විය.

අබූහනිෆා රහ්මතුල්ලාහි අලෛහි තුමාණන් රාත්‍රී කාලයේ ඇදහීම්වල නිරතව සිටීම ඕනෑ කමින් ම කඩාකප්පල් කිරීම සඳහා අධික ශබ්ද කර, ගී ගයා, සංගීත භාණ්ඩ උපයෝගි උපද්‍රව ඇති කළේය. මේ පිළිබඳව මෘදුව පැවසුවද කිසිදු ප්‍රයෝජනයක් ලැබුනේ නැත. ඊට අමතරව තමන්ගේ ක්‍රියාව දිනෙන් දින වැඩිකළේ ය. දවසක් ඔහුගේ ගීතයක් අබූහනිෆා (රහ්මතුල්ලාහි අලෛහි) තුමාගේ කන්වලට ඇසුනේ නැත. ඒ නිසා ඔහු එම ස්ථානයේ සිටින බවට කිසිඳු සලකුණක් ද දක්නට නොහැකි විය. "පව් කිසියම් අසනීපයක් ද?" යනුවෙන් කල්පනා කල විද්වතා ඔහු පිළිබඳව විමසුවේ ය. එවිට ඔහු රජයට විරුද්ධව කළ වැරැද්දකට සිරකර ඇති බව දැනගන්නට ලැබුණි. වහාම ඉමාම් අබූහනිෆා (රහ්මතුල්ලාහි අලෛහි) තුමා, පසු දින උදේ අසල් වැසියා මුණගැසී ඔහුට තමන්ගේ කණගාටුව පළ කළ අතර ඔහුව සිරගෙයින් නිදහස් කර ගැනීම සඳහා එහි ගොස් ඔහුව හමු විය. තමා සැම විට උපද්‍රවයක් කළ විද්වතා තමා හමුවීමට පැමිණ සිටින බව දැනගත් ඔහු වේදනාවට පත් වූහ. එතුමාගේ උසස්කම  වැරුද්ද තේරුම්ගෙන නැවත සකස් විය. එතුමාගේ උසස්කම පෙනෙන්නේ, දුදනෙක්ව කොතරම් දුරට වෙනස් කලේ ද යන්න මතය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මුඅත්තා යුද්ධයට හමුදව යවන අවස්ථාවේ කෝවිල්වල සිටින අයට හිරිහැර නොකරන ලෙසත් කාන්තාවන්, ළදරුවන්, වැඩිහිටියන් ආදී අය නොමරන ලෙස ද මිනිසුන්හට ඵලදයී ගස්කොළන් නොකපන ලෙස ද දේශනා කළහ. මෙම දේශනාව යුද්ධ ධර්මය ගෙන හැර පවසා ඇත.

6 වන  හිජ්රි වසරේ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ක්‍රිස්තියානි ආගමිකයන්ට ලබාදෙන ලද ශාසනයේ සියලුම අයිතිවාසිකම් ලබාදෙන ලදී. එම ශාසනයේ ක්‍රිස්තියානි වරුන් යුක්තිගරුකව සහ ඔවුන්ට අයිති වස්තූන් සම්පූර්ණ නිදහසින් පවත්වනු ඇතැයි ද ඔවුන්ගේ ආගම සහ දේපළ නඩත්තු කිරිමේ දී සම්පූර්ණ ආරක්ෂාව ලබා දෙන බවත් පවසා තිබුණි.

ඒ සමග හුදෙබියා ගිවිසුම මුස්ලිම් වරුන්ට මහත් ජයග්‍රහණයක් ලෙස සැලකේ "අපි ඔබට ඉතා පැහැදිලි ජයග්‍රහණයක් ලබා දුන්නෙමු" (අල් කුර්ආන්) (48:1) යනුවෙන් අල්ලාගෙන් මෙය පහළ විය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් අබූසුෆ්යාන්ට ලබාදීමට යන දඬුවම කුමක් ද යන්න දැනගැනීමට සහාභාවරු බලාපොරොත්තුවෙන් සිටියහ. නමුත් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ නපුරුම විරෝධියා වෙත දක් වූ කරුණාව දුටු සහාභාවරු විස්මයට පත් වූහ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් හට අබූ සුෆ්යාන් විසින් පසුගිය කාලයේ කළ දුෂ්ටකම සහ වැරදි ද අමතක කොට සමාව දුන්නේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ මෙම උසස් පැවැත්ම, අබූ සුෆ්යාන් ගේ දැඩි සිත ඉස්ලාමය පිළිගැනීමට සැලැස්සුවේ ය.

අබූසුෆ්යාන් ඉස්ලාමය වැළඳගත් පසු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් කෙරෙහි මක්කාවේ පැවති විරෝධතාවය අඩුවීමට පටන් ගැනුණි.

කුරෙෂිවරුන් විසින් කරන ලද දුෂ්ටකම් සහ බැණවැදීම් සහ වැරදි අමතක කර සමාව දුන්හ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ලෝකයට නීතිගරුක සම්පූර්ණ සමානාත්මතාවය හඳුන්වා දුන්හ. ඉස්ලාමීය සමාජ ක්‍රමයේ උසස් කුලේ අය, පහත් කුලේ අය පොහොසත් දුප්පත්, සුදු ජාතීන්, කළු ජාතීන්, අරාබි වරුන්, අරාබි නොවන අය යනුවෙන් වෙනසක් නැත.
"අල්ලාහ් ගේ අධිපතිකම සහ බලය ව්‍යාප්ත වී තිබෙන මෙම ලෝකයේ මිනිස් ජීවීන් සියල්ල ම සමානය." යනුවෙන් ද ප්‍රකාශ කරන ලදී.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වෙත දක්නට ලැබුණු විශ්වාසය, ඉවසීම, පාරිශුද්ධත්වය, ආදරය, කරුණාව සහ උසස්කම ආදී සාරධර්මයන් ද, විරුද්ධවාදීන් දැක්වූ උසස්කම ද, යුදෙව්වරුන් සහ ක්‍රිස්තියානි අය අතර දැක්වූ ඉවසිලිවන්ත භාවයෙන් යුත් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් ඉතිහාසයේ ගෞරව ලත් මිනිසෙකු ලෙස වෙනස් විය.

අප රටේ විවිධ ආගම් අදහන, අනුගමනය කරන ජනයා වාසය කරති. මුස්ලිම්වරුන්, ක්‍රිස්තියානි, හින්දු, බෞද්ධ යන අපි අපගේ ආගමට ගරු කරන පරිදි මෙන් ම සෙස්සන් ඔවුන්ගේ ආගමට ගරු කළ යුතු ය.

එමනිසා කුමන ආගමක වුනත් ඔවුන්ට අප ගෞරව කළ යුතුයි. "අසල්වැසියා වෙනත් ආගමකට අයත් කෙනෙකු නම් ඔවුන්ට ආදරය කළ යුතු යැ"යි දෙවියන්ගේ අණ වේ.

වෙනත් අය වඳින දෙවිවරුන්ට නින්ද කිරීම එතරම් හොඳ දෙයක් නොවේ. තේරුමක් නැති සණ්ඩු සරුවල් ඇතිවීමට ඉඩදිය යුතු නොවේ. ඔවුන්ගේ දේවස්ථානවලට ගොස් ඔවුන්ට බාධා නොකළ යුතු ය.

ලංකාවේ විවිධ ආගමට අයත් අය වාසය කරති. ඒ අය සමග සන්තෝෂයෙන් සහ සමාදනයෙන් ජීවත් වීම අපේ යුතුකමකි. අප අතර සන්සුන් ව, සමාදනයෙන්, හා ශාන්ති පැවැත්වීමට අල්කුර්ආනය, නබිතුමාණන්ගේ දේශනයන් අපට මග පෙන්වයි. අල්ලාහ් මිනිසුන් සියලු දෙනා ම එකම අන්දමට මවා ඇත. සියලු දෙනා ම මිනිස් කුලයට අයත් ය. මෙවැනි පුළුල් අදහසින් ජීවත් වීමට පුරුදු විය යුතුයි.

අපගේ අදහස් වචනයෙන් හා යහ ක්‍රියාවෙන් ආදියෙන් අන් ආගමිකයින්ගේ ගරුත්වය ලබාගත යුතු ය. මිනිස් සමාජයේ සිත, සාරධර්ම සහ විනය විධිමත්ව පිහිටේ නම් ලෝකයේ ශාන්තිය හා සමාදනය අවබෝධය ඇති කිරීම සෑම මුස්ලිම්වරයෙකුගේ ම යුතුකම වේ.

## අභ්‍යාස

- මුස්ලිම් සමාජයේ අනන්‍යතාව කුමක් ද?
- වෙනත් සමාජය යනුවෙන් සඳහන් වන්නේ කවරහු ද?
- මිනිසෙකු යනුවෙන් එක් මුස්ලිම් වරයෙකුට සහ වෙනත් සමාජයන් අතර ඇති සම්බන්ධතාවය කෙසේ ද?
- වෙනත් සමාජයක් / ආගමක් සමඟ අප විසින් ඇතිකර ගත යුතු සම්බන්ධතාවයන් කුමක් ද?

## පැවරුම්

1). අපගේ පරිසරයේ වාසය කරන විවිධ ආගමිකයින් සමග අවබෝධතාවයෙන් යුතුව ජීවත් වීමේ අවශ්‍යතාවය ඉස්ලාමයේ දේශනාවල් මගින් විස්තර කර ලියන්න.

2). විවිධ ආගමිකයින් අතර අවබෝධතාවය සහ එකඟත්වය දියුණු කරවිය හැකි ෂරීආවට අයත් ක්‍රියාකාරකම් නිදසුන් සමග විස්තර කරන්න.